විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
மின்வலு மற்றும் எரிசக்தி அமைச்சு
MINISTRY OF POWER AND ENERGY



# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயற்பாட்டு அறிக்கை
# Annual Performance Report
# 2019

# 2019 වර්ෂය සඳහා

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

**ආයතනයේ නම - විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය**

**වැය ශීර්ෂ අංකය - 119**

## අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

# පරිච්ඡේදය 01
# ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

විදුලිය රටක සීඝ්‍ර ආර්ථික වර්ධනයට මෙන්ම එහි පුරවැසියන්ගේ ජීවිතවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමටද දායක වන අත්‍යාවශ්‍ය සාධකයකි. මෙරට විදුලිය හා පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ වගකීම අංක 2103/33 දරණ 2018.12.28 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් මෙම අමාත්‍යාංශය වෙත පවරා දී ඇත. ඒ අනුව, විදුලිය හා පුනර්ජනනීය බලශක්ති විෂයය සහ එම විෂයයට අදාළ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම ඇතුළු වගකීම් සහ බලතල විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය වෙත පැවරී ඇත.

සැමට සැමදා විදුලිය ලබා දීමේ අරමුණ යථාර්ථයක් බවට පත් කරමින් 2019 වර්ෂය අවසාන වන විට මෙරට ගෘහස්ථ විදුලියනය 99.9%ක මට්ටමකට ලඟා කරවීමට මෙම අමාත්‍යාංශයට හැකි විය. ජාතික විදුලි පද්ධතිය වෙත නිරන්තරයෙන් සිදු කරනු ලබන සංවර්ධන කටයුතු හේතුවෙන් දකුණ, බස්නාහිර, සබරගමුව, උතුරුමැද හා නැගෙනහිර පළාත්වල විදුලියන මට්ටම 100% කරා ඉහළ නැංවීමටත් නුවර, නුවරඑළිය, අම්පාර හා වවුනියාව දිස්ත්‍රික්කවල 100% විදුලියන මට්ටමට ඉහළ නැංවීමටත් හැකි විය.

වාර්ෂිකව 4% - 5% ක් අතර ඉහළ යන විදුලි ඉල්ලුමෙහි වර්ධනය සපුරාලීම සඳහා විදුලි ජනන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමත්, විදුලි බලාගාරවලින් ජනනය කරනු ලබන විදුලිය ලබා ගැනීම සඳහාත් සහ විශ්වසනීය අඛණ්ඩ විදුලි සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ජාලයන් සහතික කරලීම සඳහා ව්‍යාපෘති ගණනාවක් මෙම අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ. පරිසරය සුරකින අතරම විදුලි පද්ධතියේ සිදුවන විදුලි හානිය අවම කරලීම සඳහාත් ඉල්ලුම් පාර්ශ්වීය විදුලි කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහාත් මෙම අමාත්‍යාංශය විශේෂ අවධානයක් යොමු කොට ඇත.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

### දැක්ම

ජාතියේ බලශක්ති සුරක්ෂිතතාවය තහවුරු කිරීම.

### මෙහෙවර

ජාතික ආර්ථික සෞභාග්‍යය උදෙසා ඇවැසි ගුණාත්මක, විශ්වසනීය, තිරසාර හා මිල දැරිය හැකි බලශක්ති සැපයුමක් සහතික කිරීම.

### අරමුණු

1. මේ වන විට රටෙහි පවත්නා මෙගා වොට් 4,472ක් වන ජනන ධාරිතාව, පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයේ උපරිම ශක්‍යතාවයක් සහිතව සංවර්ධනය කිරීම මගින්, වසර 2025 වන විට මෙගා වොට් 6,900ක් දක්වා වර්ධනය කිරීම.

2. සම්ප්‍රේෂණ ජාලය වැඩිදියුණු කිරීම.
   වසර 2025 වන විට කිලෝ වෝල්ට් 220 මාර්ග කි.මී. 602 සිට කි.මී. 1,300ක් දක්වා
   වසර 2025 වන විට කිලෝ වෝල්ට් 132 මාර්ග කි.මී. 2,310 සිට කි.මී. 3,000ක් දක්වා

3. ගුණාත්මක සේවාවක් සැපයීම හා 100 %ක ගෘහස්ත විදුලියන මට්ටමක් පවත්වා ගැනීම සඳහා බෙදාහැරීම් ජාලය වැඩිදියුණු කිරීම.

4. මේ වන විට 35 % ක මට්ටමක පවත්නා පුනර්ජනනීය බලශක්ති ධාරිතාව , පිරිසිදු පුනර්ජනනීය බලශක්ති මගින්, වසර 2030 වන විට 80 % දක්වා වර්ධනය කිරීම.

5. වසර 2025 වන විට පද්ධතියේ තාක්ෂණික හා වාණිජ හානිවීම් 9 % සිට 8 % දක්වා අඩු කර ගැනීම.

6. විදුලි උපාංග මෙරට තුළ ම නිෂ්පාදනය කිරීම ධෛර්යමත් කිරීම තුළින්, රටෙහි විදුලිබල පද්ධතිය, සුහුරු ජාලයක් බවට පරිවර්තනය කිරීම .

## 1.3 ප්‍රධාන කාර්යයන්

අංක 2103/33 දරණ 2018.12.28 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය වෙත පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් පැවරී ඇත.

- විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන විෂයයට සහ අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම සහ ඇගයීම.
- බලශක්ති සම්පත් පාලනය, නියාමනය හා උපයෝගීකරණය උදෙසා උචිත බලශක්ති ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම.
- සූර්ය බලය, ජලය, තාපය, ගල් අඟුරු, අපද්‍රව්‍ය සහ සුළං යනාදී මූලාශ්‍රයන් මගින් විදුලිය සහ අනෙකුත් බලශක්තිය නිපදවීම සම්බන්ධ කටයුතු ගවේෂණය, සැලසුම්කරණය, අධීක්ෂණය සහ සංවර්ධනය
- හරිතාගාර වායු විමෝචනය පාලනය කිරීම.
- ග්‍රාමීය විද්‍යුතනය
- බලශක්ති කාර්යක්ෂමතාව ඇතිවන පරිදි ඉල්ලුම කළමනාකරණය කිරීම සහ පුනර්ජනනීය විදුලිබල සංවර්ධනය කිරීම.
- පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය
- ආර්ථික සංවර්ධනය උදෙසා ව්‍යාපාර ක්ෂේත්‍රයේ දායකත්වය ඵලදායි ලෙස යොදා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ සැලසීම හා සානුබලයන් සැපයීම.
- ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර ඇරඹීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීමේ දර්ශකය ඉහල නැංවීමට අවශ්‍ය පියවර ගැනීම.
- පෞද්ගලික ව්‍යාපාර ක්ෂේත්‍රය මුහුණ දෙන ව්‍යාපාර ගැටළු හා බාධාවන් දුරු කිරීම සඳහා අවශ්‍ය ආයතනික සම්බන්ධීකරණය සිදු කිරීම
- රාජ්‍ය හා පෞද්ගලික අංශ අතර හවුල් ව්‍යාපාර (PPP) ආරම්භ කිරීම සඳහා පහසු හා කාර්යක්ෂම ක්‍රමවේද හඳුන්වාදීම.
- අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයන්ට අදාළ කටයුතු.
- අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතනයන් අධීක්ෂණය කිරීම.

අංක 2153/12 දරණ 2019.12.10 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් අමාත්‍යාංශයේ නාමය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය ලෙස සංශෝධනය කරන ලද අතර අමාත්‍යාංශය වෙත පැවරී තිබූ කාර්යයන් හා කර්තව්‍යයන් එකී ගැසට් නිවේදනය මගින් පහත පරිදි සංශෝධනය කර ඇත.

- විදුලිබල හා බලශක්ති විෂයයට සහ අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම සහ ඇගයීම.
- සූර්ය, ජලය, තාපය, ගල් අඟුරු, අපද්‍රව්‍ය සහ සුළං යනාදී මූලාශ්‍රයන් මගින් පුනර්ජනනීය බලශක්ති, විදුලිය සහ අනෙකුත් බලශක්තිය නිපදවීම සම්බන්ධ කටයුතු ගවේෂණය, සැලසුම්කරණය, සංවර්ධනය සහ අධීක්ෂණය
- හරිතාගාර වායු විමෝචනය පාලනය කිරීම.
- ග්‍රාමීය විද්‍යුතනය
- බලශක්ති කාර්යක්ෂමතාව ඇතිවන පරිදි ඉල්ලුම කළමනාකරණය කිරීම සහ පුනර්ජනනීය විදුලිබල සංවර්ධනය කිරීම.
- බලශක්ති සම්පත් පාලනය, නියාමනය හා උපයෝගීකරණය උදෙසා උචිත බලශක්ති ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම
- ඛනිජතෙල් ආශ්‍රිත නිෂ්පාදනය හා ස්වාභාවික ගෑස් ආනයනය කිරීම පිරිපහදු, ගබඩා කිරීම, බෙදාහැරීම සහ අලෙවි කිරීම සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම.
- ඛනිජතෙල් නිෂ්පාදනය සහ පිරිපහදුව සම්බන්ධ කටයුතු
- ඛනිජ තෙල් හා ස්වාභාවික ගෑස් ගවේෂණය හා ඒ ආශ්‍රිත කටයුතු
- ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රභවයන්ගෙන් ගෑස් හා අතුරු නිෂ්පාදන කටයුතු තොග පවත්වා ගැනීම හා නිෂ්පාදනය හා බෙදාහැරීම
- ඉන්ධන සැපයීම හා බෙදාහැරීමට අදාළ වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතනයන් අධීක්ෂණය කිරීම සහ අනෙකුත් සියළුම විෂයයන්ට අදාළ කටයුතු.

## 1.4 සංවිධාන සටහන



ලේකම්
අතිරේක ලේකම් (පාලන හා ප්‍රසම්පාදන)
අතිරේක ලේකම් (සංවර්ධන හා සැලසුම්)
අතිරේක ලේකම් (විදුලිබල හා බලශක්ති)
අතිරේක ලේකම් (තාක්ෂණ)
ප්‍රධාන මූල්‍ය නිලධාරි
ජ්‍යෙ.ස.ලේ. (පාලන)
ජ්‍යෙ.ස.ලේ. (ප්‍රසම්පාදන)
අධ්‍යක්ෂ (සංවර්ධන)
අධ්‍යක්ෂ (සැලසුම්)
අධ්‍යක්ෂ (විදුලිබල හා බලශක්ති)
අධ්‍යක්ෂ (තාක්ෂණ)
ප්‍රධාන අභ්‍යන්තර විගණක
සහකාර ලේකම් (පාලන)
නීති නිලධාරි
සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)
සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන)
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
ගණකාධිකාරි
පරිපාලන නිලධාරි
භාෂා පරිවර්තක
තොරතුරු තාක්ෂණ නිලධාරි
සහයක කාර්යය මණ්ඩලය
සහයක කාර්යය මණ්ඩලය
තොරතුරු තාක්ෂණ සහකාර
සහයක කාර්යය මණ්ඩලය
සහයක කාර්යය මණ්ඩලය
සහයක කාර්යය මණ්ඩලය
සහයක කාර්යය මණ්ඩලය
සහයක කාර්යය මණ්ඩලය
සහයක කාර්යය මණ්ඩලය

## 1.5 අමාත්‍යාංශයේ විෂයය පථයට අයත්වන රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන

1. ලංකා විදුලිබල මණ්ඩලය
2. සී/ස. ලංකා විදුලි පුද්. සමාගම (LECO)
3. සී/ස. එල්ටීඑල් හෝල්ඩිංග්ස් පුද්. සමාගම
4. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA)
5. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව
6. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය
7. සී/ස. ලංකා ගල් අඟුරු පුද්. සමාගම
8. සී/ස. ශ්‍රී ලංකා එනර්ජීස් පුද්. සමාගම

## 1.6 අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රධාන අංශ

### 1. විදුලිබල හා බලශක්ති අංශය

ප්‍රධාන කාර්යයන්:

- තාප හා ජල විදුලි උත්පාදනය සම්බන්ධ සියලු ප්‍රතිපත්තිමය කරුණු සහ විශාල හා මධ්‍ය පරිමාණ විදුලි උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රය සඳහා පරිසර හිතකාමී ඉන්ධනයක් ලෙස ද්‍රවීකෘත ස්වභාවික වායු හඳුන්වාදීමේ කටයුතු
- විශාල සහ මධ්‍ය පරිමාණයේ ජල විදුලි බලාගාර ව්‍යාපෘති, තාප විදුලි බලාගාර ව්‍යාපෘති, ගල් අඟුරු බලාගාර ව්‍යාපෘති අනුමත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඒවාට අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු
- ඉහත සඳහන් ව්‍යාපෘති වලට අදාලව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

### 2. සැලසුම් අංශය

ප්‍රධාන කාර්යයන් :

- විදුලිබල ක්ෂේත්‍රයේ සැලසුම් සකස් කිරීම
- ව්‍යාපෘති වැඩසටහන් සංවර්ධනය හා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම
- ව්‍යාපෘති ප්‍රගතිය අධීක්ෂණය කිරීම හා සමාලෝචනය
- පර්යේෂණ හා සංවර්ධන කටයුතු
- ආපදා කළමනාකරණ වැඩසටහන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- සංවර්ධන ව්‍යාපෘති සඳහා වන වාර්ෂික අයවැය සකස් කිරීම
- විදුලිබල ක්ෂේත්‍රයට අදාළ දේශගුණික විපර්යාස පිළිබඳ කටයුතු හා පාරිසරික කටයුතු
- තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමට අදාළ කාර්යයන්
- ස්ත්‍රී පුරුෂභාවය පදනම් කර ගත් අයවැය වැඩසටහන්වලට අදාළ කාර්යයන්

## 3. සංවර්ධන අංශය

ප්‍රධාන කාර්යයන් :

- විදුලිබල ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම.
- රට තුළ ග්‍රාමීය විදුලියන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ව්‍යාපෘති මූල්‍යායනය සහ විදේශ ආධාර ආයතන සමග සම්බන්ධීකරණය - බහුපාර්ශ්වීය සම්බන්ධීකරණය.
- පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය හා ඒ සඳහා පහසුකම් සැලසීම.
- තොරතුරු තාක්ෂණ කාර්යයන් සංවර්ධනය.
- තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ වන කාර්යයන්.

## 4. තාක්ෂණ අංශය

ප්‍රධාන කාර්යයන් :

- ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ විධිවිධාන සංශෝධනය කිරීම හා නීති රෙගුලාසි බලාත්මක කිරීම, ප්‍රතිපත්ති මාර්ගෝපදේශ නිකුත් කිරීම, විදුලි අයක්‍රම සකස් කිරීම, විදුලි බලපත්‍ර නිකුත් කිරීම ආදී කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.
- ලංකා විදුලිබල මණ්ඩලය සම්බන්ධ නීති සම්පාදන කටයුතු සිදු කිරීම.
- පරමාණුක බලශක්ති මණ්ඩලය, පරමාණුක බලශක්ති නියාමන කොමිෂන් සභාව සම්බන්ධ නීති සම්පාදන කටයුතු සිදු කිරීම.
- ඉඩම් අත්පත් කරගැනීම හා ව්‍යාපෘති අනුමැතිය හැර සියලු විදුලි උත්පාදන ව්‍යාපෘතිවලට (ජල විදුලිය, න්‍යෂ්ඨික බලය, ගල් අඟුරු සහ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති) අදාළ තාක්‍ෂණික කරුණු සම්බන්ධ කටයුතු.
- සියලු විදුලිබල හා බලශක්ති සැලසුම්කරණ කටයුතු අධීක්‍ෂණය හා පාලනය කිරීම.
- බලශක්ති සංරක්ෂණය හා අදාළ තාක්‍ෂණික කටයුතු.
- විදුලි උත්පාදන බලාගාරවල ක්‍රියාකාරිත්වයේ අධීක්ෂණය, පාලනය හා සම්බන්ධ තාක්ෂණික කරුණු, බිඳවැටීම් වළක්වා ගැනීම, අවම කිරීම, සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම.
- විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ විදුලිබල හා පුනර්ජනනනීය බලශක්ති අංශයට අදාළ SAARC, BIMSTEC, USAID, ESCAP, IEF වැනි අන්තර්ජාතික සංවිධාන සමඟ ඊට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

## 5. ටෙන්ඩර් අංශය

ප්‍රධාන කාර්යයන් :

- අමාත්‍ය මණ්ඩලය පත් කළ ප්‍රසම්පාදන කමිටු වලට අදාළ කටයුතු
- අමාත්‍ය මණ්ඩලය පත් කළ සාකච්ඡා කමිටු වලට අදාළ කටයුතු
- අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු වලට අදාළ කටයුතු
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වලට අදාළ ප්‍රසම්පාදන කටයුතු සඳහා MPC හා

SCAPC රැස්වීම් සංවිධානය කිරීම.

- අදාළ ප්‍රසම්පාදන සඳහා අවශ්‍ය අවස්ථාවන්හි දී අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම.
- ප්‍රසම්පාදන කටයුතු හා අදාළ ප්‍රගති වාර්තා රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- ප්‍රසම්පාදනයන්ට අදාළ අනෙකුත් කටයුතු

## 6. පාලන අංශය

ප්‍රධාන කාර්යයන් :

- අමාත්‍යාංශයට අදාල සියළුම පරිපාලන කටයුතු
- අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ පෞද්ගලික ලිපිගොනු නිසි පරිදි පවත්වා ගෙන යාම, නඩත්තු කිරීම සහ කාර්ය සාධනය සම්බන්ධ කටයුතු
- මානව සම්පත් සංවර්ධනයට අදාල කටයුතු
- පාර්ලිමේන්තු ප්‍රශ්න සම්බන්ධ කටයුතු
- මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව සම්බන්ධ කටයුතු
- ආංශික අධීක්ෂණ කමිටු, විදුලිබල හා පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ අනු කාරක සභාව සම්බන්ධ කටයුතු
- අමාත්‍යාංශයේ විෂය පථයට අයත්වන සියළුම ව්‍යවස්ථාපිත ආයතනයන්හි කටයුතු අධීක්ෂණය කිරීම සහ අනෙකුත් විෂයන්ට අදාල කටයුතු
- අමාත්‍යාංශයේ සියළුම ප්‍රවාහන සේවා හා සියළුම නඩත්තු සේවා ඉටු කිරීම සම්බන්ධ කටයුතු

## 7. ගිණුම් අංශය

ප්‍රධාන කාර්යයන් :

- මෙහෙයුම් කටයුතු හා සංවර්ධන කටයුතු යන වැඩ දෙක යටතේ වෙන් කර ඇති මූල්‍ය ප්‍රතිපාදන වලට අදාල වියදම් ගිණුම්ගත කිරීම සම්බන්ධව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ කටයුතු සිදු කිරීම.
- විදුලිබල උත්පාදනය, විදුලිබල සම්ප්‍රේෂණය සහ විදුලිබල බෙදාහැරීම යන ප්‍රධාන කාර්යයන් තුන සඳහා වන මූල්‍ය ප්‍රතිපාදන, සංවර්ධන වැඩසටහන් යටතේ විදේශීය අරමුදල් හා දේශීය අරමුදල් උපයෝගී කරගනු ලබන ව්‍යාපෘතිවල වියදම් වාර්තා කරමින් ප්‍රතිපාදන ඉක්මවා නොයන පරිදි පාලනය කිරීම.

## 8. අභ්‍යන්තර විගණන අංශය

ප්‍රධාන කාර්යයන් :

- කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ මගපෙන්වීම් අනුව අමාත්‍යාංශයේ වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.
- අනුමත අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
- අමාත්‍යාංශයේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම් වලට අදාළ සියලු කාර්යයන් ඉටු කිරීම.

- විගණකාධිපති විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම සම්බන්ධයෙන් අනෙකුත් අංශ වලට අවශ්‍ය මගපෙන්වීම් ලබා දීම.
- අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන ව්‍යවස්ථාපිත ආයතන වල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම හා සම්බන්ධ කටයුතු සිදු කිරීම.
- ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ උපදෙස් මත විශේෂ විමර්ශන පැවැත්වීම.

## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

| | ව්‍යාපෘතියේ නම | (b) ආධාරක ආයතනය | (c) ඇස්තමේන්තු ගත පිරිවැය (රු. මි.) | (d) ව්‍යාපෘති කාල සීමාව |
|---|---|---|---|---|
| ජනන ව්‍යාපෘති | | | | |
| 1 | මෙ.වො 31 මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදි කිරීම | ආසියානු සංවර්ධන බැංකුව | 18,809 | 2014-2023 |
| 2 | මෙ.වො. 35 බ්‍රෝඩ්ලන්ඩ් ජල විදුලි බලාගාරය ඉදි කිරීම | චීනය | 9,424 | 2013-2020 |
| 3 | මෙ.වො. 120 උමා ඔය ජල විදුලි බලාගාරය | ඉරානය | ඇ.ඩො.මි. 530 | 2010-2020 (සැප්තැම්බර්) |
| 4 | මෙ.වො. 100 මන්නාරම දූපතේ දකුණු වෙරළ තීරයේ සුළං බල ගොවිපල | ආසියානු සංවර්ධන බැංකුව | 24,162 | 2015-2020 |
| සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ව්‍යාපෘති | | | | |
| 5 | මන්නාරම සම්ප්‍රේෂණ යටිතලපහසුකම්<br>ලොට් A: කි.වෝ. 220/33 මන්නාරම ග්‍රිඩ් උපපොල ඉදි කිරීම<br>ලොට් B: නව අනුරාධපුර ග්‍රිඩ් උපපොලේ සිට වව්නියාව හරහා මන්නාරම ග්‍රිඩ් උපපොල දක්වා කි.මී 130ක කි.වෝ. 220 ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ මාර්ගය | ආසියානු සංවර්ධන බැංකුව | 4,149.7 | 2015-2020 |
| 6 | සම්ප්‍රේෂණ යටිතල පහසුකම් ධාරිතාව පුළුල් කිරීම<br>ලොට් A: කප්පල්තුරේ කි.වෝ. 220/132 ග්‍රිඩ් උපපොල ඉදි කිරීම සහ කෙරවළපිටිය, කටුනායක, ත්‍රිකුණාමලය ග්‍රිඩ් උපපොල ආවර්ධනය<br>ලොට් B1: නව අනුරාධපුර ග්‍රිඩ් උපපොල ආවර්ධනය සහ කැස්බෑව, කළුතර හා පැරණි අනුරාධපුර ග්‍රිඩ් උපපොල ඉදි කිරීම<br>ලොට් B2 : කප්පල්තුරේ, කළුතර, කැස්බෑව හා පැරණි අනුරාධපුර ග්‍රිඩ් උපපොල වෙත කි.වෝ. 132 සම්ප්‍රේෂණ රැහැන් මාර්ග ඉදි කිරීම | ආසියානු සංවර්ධන බැංකුව | (A: 2525.63<br>B1: 2737.97<br>B2: 692.62)<br>5955.22 | 2016 මාර්තු - 2020 පෙබරවාරි |

| | | | | |
|---|---|---|---|---|
| 7 | මධ්‍ය වෝල්ටීයතා බෙදාහැරීම් ජාලයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම<br>(වව්නතිව් ග්‍රිඩ් උපපොලේ සිට ඌරණි, කරදියනාරු, කලවංචිකුඩු හා තලන්කුඩා දක්වා, මාදම්පේ ග්‍රිඩ් උපපොලේ සිට බෝවත්ත දක්වා කි.වෝ. 33 කුළුණු මාර්ග. ඌරණි, කරදියනාරු, කලවංචිකුඩු හා තලන්කුඩා DBB ගැන්ට්‍රි. බෝවත්ත SBB ගැන්ට්‍රිය) | ආසියානු සංවර්ධන බැංකුව | 1040 | 2016 මාර්තු - 2019 දෙසැම්බර් |
| 8 | හම්බන්තොට කි.වෝ. 220 පද්ධති සංවර්ධනය (අදියර 1)<br>ලොට් A - හම්බන්තොට කි.වෝ. 220 ග්‍රිඩ් උපපොල සංවර්ධනය<br>ලොට් B - නව පොල්පිටිය - හම්බන්තොට කි.මී. 150ක කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය | ආසියානු සංවර්ධන බැංකුව | 7660 (A: 1866 B: 5794) | 2017 මැයි - 2021 ජනවාරි |
| 9 | මන්නාරම - නඩුකුඩා සම්ප්‍රේෂණ සංවර්ධනය (අදියර 2)<br>ලොට් A - නඩුකුඩා කිලෝ වෝල්ට් 220/33 ග්‍රිඩ් උපපොල ඉදි කිරීම, මන්නාරම කි.වෝ. 220/33 ග්‍රිඩ් උපපොල ආවර්ධනය,<br>ලොට් B1 - මන්නාරම - නඩුකුඩා කි.මී. 30ක කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය<br>ලොට් B2 A: (AFD) - පාදුක්ක - හොරණ කි.මී. 25ක කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය<br>ලොට් B2B: (AFD) - හබරණ වාලච්චේන කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගයේ දෙවන පරිපථය සවිබල ගැන්වීම | ආසියානු සංවර්ධන බැංකුව | 5172 (A: 2698 B1:1380 B2:1094) | 2018 මාර්තු - 2021 නොවැම්බර් |
| 10 | කොළඹ B ග්‍රිඩ් උපපොල ඉදි කිරීම<br>කොළඹ C - කොලොන්නාව ග්‍රිඩ් උපපොල දක්වා කි.වෝ. 132 තනි ආදාන හා ප්‍රතිදාන සම්බන්ධතාව 800mm2 රැහැන්<br>කොළඹ C හා කොලොන්නාව ග්‍රිඩ් උපපොල ආවර්ධනය (AFD) | ආසියානු සංවර්ධන බැංකුව | 1261 | 2018 - 2021 ඔක්තෝබර් |
| 11 | කොටුගොඩ ග්‍රිඩ් උපපොල ආවර්ධනය<br>කොලොන්නාව ස්ටැන්ලි ග්‍රිඩ් උපපොල ආවර්ධනය<br>පාදුක්ක වහරු පොළ ආවර්ධනය<br>හොරණ ග්‍රිඩ් උපපොල ආවර්ධනය<br>දෙහිවල ග්‍රිඩ් උපපොල ආවර්ධනය<br>මාදම්පේ ග්‍රිඩ් උපපොල ආවර්ධනය | ආසියානු සංවර්ධන බැංකුව | 2214.2 | 2018 - 2021 ඔක්තෝබර් |
| 12 | ලොට් B:<br>බියගම කි.වෝ. 220/33 ග්‍රිඩ් උපපොල ඉදි කිරීම<br>බියගම ග්‍රිඩ් උපපොල ආවර්ධනය | ආසියානු සංවර්ධන බැංකුව | 1434 | 2018 - 2021 ඔක්තෝබර් |
| 13 | විදුලි සැපයුමේ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - පැකේජ 1, 2 ,3 : ග්‍රාමීය විදුලියන යෝජනාක්‍රම 106ක් සඳහා භාණ්ඩ ප්‍රසම්පාදනය | ආසියානු සංවර්ධන බැංකුව | 1866 | 2016-2019 |
| 14 | පැකේජ 4: කි.වෝ. 33 කුළුණු මාර්ග කි.මී 300ක් සහ කි.වෝ. 33 සම්බන්ධන ගැන්ට්‍රි 13ක් ඉදි කිරීම | ආසියානු සංවර්ධන බැංකුව | 7350 | 2016 දෙසැම්බර් - 2021ජූලි |
| 15 | පැකේජ 5 : ග්‍රාමීය විදුලියන ජාලය පුළුල් කිරීම හා බෙදාහැරීම් කාර්යසාධන අධීක්ෂණය සඳහා භාණ්ඩ සැපයුම හා බෙදා හැරීම | ආසියානු සංවර්ධන බැංකුව | 2658 | 2016 දෙසැම්බර් - |

| | | | | |
|---|---|---|---|---|
| | ලොට් 1: බෙදාහැරීම් මනු සහ මොඩම<br>ලොට් 2: මනු සඳහා ධාරා පරිනාමක<br>ලොට් 3: විහර බෙදුම් වහරු හා ස්වයංක්‍රීය ප්‍රතිවැසුම්<br>ලොට් 4: වානේ මනු බහලුම්<br>ලොට් 5: කි.වෝ. 33 ඇහැසි පොදු බහන් හා උපාංග | | | 2020 පෙබරවාරි |
| 16 | පැකේජ 6 : නයිනතිවු, අනලතිවු හා ඩෙල්ෆ්ට් දූපත්වල සුළං, සූර්ය හා ඩීසල් දෙමුහුම් පුනර්ජනනීය බලශක්ති බලාගාර ඉදි කිරීම | ආසියානු සංවර්ධන බැංකුව | 619 | 2016 දෙසැම්බර් - 2022 මාර්තු |
| 17 | **පැකේජ 7 : පද්ධතියේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**<br>ලොට් A1: පන්නිපිටිය ග්‍රිඩ් උපපොලේ 100Mvar BSC ඉදි කිරීම<br>ලොට් A2: බියගම ග්‍රිඩ් උපපොලේ +100/-50 MVAR SVC ඉදි කිරීම | ආසියානු සංවර්ධන බැංකුව | A1:1097<br>A2: 1595 | 2018- |
| 18 | **විදුලි පද්ධතියේ විශ්වසනීයත්වය සවිබල ගැනීවීමේ ව්‍යාපෘතිය (PSRSP)**<br>පැකේජ 1 - (ලොට් A) - කලවාන හා මීගමුව කි.වෝ. 132 ග්‍රිඩ් උපපොල ඉදි කිරීම<br>(ලොට් B) - මීරිගම කි.වෝ. 220 ග්‍රිඩ් උපපොල, වහරුපොල සමග ඉදි කිරීම, මාතර කි.වෝ. 132 ග්‍රිඩ් උපපොල ආවර්ධනය<br>පැකේජ 2 -(ලොට් A) - මාතර - හම්බන්තොට කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය, හම්බන්තොට - තිස්සමහාරාම කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය, හෝමාගම ග්‍රිඩ් උපපොල සිට හොරණ-පාදුක්ක කි.වෝ. 132 මාර්ගය දක්වා කි.වෝ. 132 මාර්ග කොටස, බද්දේගම ග්‍රිඩ් උපපොල සිට ගාල්ල-අම්බලන්ගොඩ කි.වෝ. 132 මාර්ගය දක්වා කි.වෝ. 132 මාර්ග කොටස ඉදි කිරීම<br>(ලොට් B) - කැලණිය රැහැන් ගැන්ට්‍රියේ සිට පැලියගොඩ ග්‍රිඩ් උපපොල දක්වා කි.වෝ. 132 භූගත රැහැන් මාර්ගය<br>පැකේජ 3 - තිස්සමහාරාම, බද්දේගම, හෝමාගම හා පැලියගොඩ කි.වෝ. 132 ග්‍රිඩ් උපපොල ඉදි කිරීම<br>පැකේජ 4 : නව අනුරාධපුර - නව හබරණ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය, කුකුළේ - කළවාන කි.වෝ 132 සම්ප්‍රේෂණ මාර්ගය සහ මීරිගම ග්‍රිඩ් උපපොලේ සිට හබරණ - වේයන්ගොඩ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය දක්වා කි.වෝ. 220 මාර්ග කොටස ඉදි කිරීම | ආසියානු සංවර්ධන බැංකුව | 22490 | 2019-2023 |
| 19 | **හබරණ - වේයන්ගොඩ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය**<br>ලොට් A: නව හබරණ කි.වෝ. 220/132/33 වහරු පොල ඉදි කිරීම<br>ලොට් B: නව හබරණ ග්‍රිඩ් උපපොලේ සිට වේයන්ගොඩ ග්‍රිඩ් උපපොල දක්වා කි.මී 146ක කි.වෝ. 220 ද්විත්ව පරිපථ තෙකලා, ද්විත්ව, අඩු හානි සන්නායක (2 x LL-TACSR) රැහැන් මාර්ගය ඉදි කිරීම | ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය / ශ්‍රී ලංකා රජය | 11,269 | 2017 මැයි - 2021 ජූනි |

| | | | | |
|---|---|---|---|---|
| 20 | **ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ජාල සංවර්ධන හා කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අදියර 1**<br>පැකේජ 1 – සම්ප්‍රේෂණ මාර්ග<br>පැකේජ 2 – ග්‍රිඩ් උපපොල<br>පැකේජ 3 – සම්ප්‍රේෂණ මාර්ග<br>පැකේජ 4 – බෙදාහැරීම් මාර්ග | ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය | 23720 | 2019-2021 |
| 21 | **පුනර්ජනනීය බලශක්ති ප්‍රතිශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය**<br>මාලිබොඩ, වේවැල්වත්ත, නාවලපිටිය හා රාගල නව ග්‍රිඩ් උපපොල ඉදි කිරීම<br>කි.වෝ. 132 නව සම්ප්‍රේෂණ මාර්ග ඉදි කිරීම<br>- පල්ලෙකැලේ - රාගල (කි.මී. 21)<br>- පොල්පිටිය - මාලිබොඩ (කි.මී. 18.5)<br>- නාවලපිටිය ග්‍රිඩ් උපපොල සිට පොල්පිටිය - කිරිබත්කුඹුර සම්ප්‍රේෂණ මාර්ගය දක්වා කි.මී. 0.5ක ආදාන සහ ප්‍රතිදාන රැහැන් මාර්ගය<br>- වේවැල්වත්ත ග්‍රිඩ් උපපොල සිට රත්නපුර - බලංගොඩ සම්ප්‍රේෂණ මාර්ගය දක්වා කි.මී. 2ක ආදාන සහ ප්‍රතිදාන රැහැන් මාර්ගය | ප්‍රංශ සංවර්ධන ඒජන්සිය | 6228 | 2015-2020 |
| 22 | **(පැකේජ 4 හා පැකේජ 5): කි.වෝ. 33 බෙදාහැරීම් කුළුණු මාර්ග හා ගැන්ට්‍රි**<br>පැකේජ 4<br>- පැරණි අනුරාධපුර ග්‍රිඩ් උපපොලේ සිට මහඉලුප්පල්ලම ගැන්ට්‍රිය දක්වා කි.වෝ. 33ද්විත්ව පරිපථ ලින්ක්ස් රැහැන් මාර්ගය සහ මහඉලුප්පල්ලම තනි බස්බාර් ගැන්ට්‍රි කොටස් දෙක, කි.මී 22<br>- ඇත්ගල ගැන්ට්‍රියේ සිට ස්ටෝෆීල්ඩ් ගැන්ට්‍රිය දක්වා කි.වෝ. 33 ද්විත්ව පරිපථ ලින්ක්ස් රැහැන් මාර්ගය සහ ඇත්ගල තනි බස්බාර් ගැන්ට්‍රි කොටස් දෙක, කි.මී 4<br>- කප්පල්තුරේ ග්‍රිඩ් උපපොලේ සිට වීනවරාය ගැන්ට්‍රිය දක්වා කි.වෝ. 33, 4 cct ලින්ක්ස් රැහැන් මාර්ගය සහ වීනවරාය ද්විත්ව බස්බාර් ගැන්ට්‍රි කොටස් දෙක, කි.මී. 08<br>- ඇඹිලිපිටිය ග්‍රිඩ් උපපොලේ සිට වෙනිවැල්ආර ග්‍රිඩ් උපපොල දක්වා කි.වෝ. 33 ද්විත්ව පරිපථ ලින්ක්ස් රැහැන් මාර්ගය සහ සූරියවැව තනි බස්බාර් ගැන්ට්‍රි කොටස් දෙක, කි.මී 10.5<br>- මතුගම ග්‍රිඩ් උපපොලේ සිට බෙන්තොට ප්‍රාථමික උපපොල දක්වා කි.වෝ. 33 ද්විත්ව පරිපථ ලින්ක්ස් රැහැන් මාර්ගය, කි.මී .11.5<br>පැකේජ 5 (ADB)<br>- ඇතුල්කෝට්ටේ සහ බෙලිගහ කි.වෝ. 33/11 ප්‍රාථමික උපපොල දෙක ආවර්ධනය<br>- රත්තනපිටිය නව 2x 10 MVA කි.වෝ. 33/11 ප්‍රාථමික උපපොල ඉදි කිරීම | ආසියානු සංවර්ධන බැංකුව / ප්‍රංශ සංවර්ධන ඒජන්සිය | 4076 | ජනවාරි 2017 - 2021 දෙසැම්බර් |

| | | | | |
|---|---|---|---|---|
| 23 | **මහ කොළඹ සම්ප්‍රේෂණ සංවර්ධනය හා හානි අවම කිරීම**<br>පැකේජ 1 (ලොට් 1,2 හා 3) නව ග්‍රිඩ් උපපොල ඉදි කිරීම සහ පවත්නා ග්‍රිඩ් උපපොල ආවර්ධනය<br>ලොට් 01: L, M හා N උපපොල ඉදි කිරීම<br>ලොට් 02 : මුල් උපකරණ නිෂ්පාදක (OEM) (Siemens) විසින් සිදු කරන ආවර්ධන / වෙනස් කිරීමේ කාර්යයන්<br>ලොට් 03 : මුල් උපකරණ නිෂ්පාදක (OEM) (ABB) විසින් සිදු කරන ආවර්ධන / වෙනස් කිරීමේ කාර්යයන්<br>පැකේජ 02<br>කි.වෝ. 220 රැහැන් කි.මී. 20ක් හා කි.වෝ. 132 රැහැන් කි.මී. 14ක් ඉදි කිරීම<br>කි.වෝ. 11 භූගත රැහැන් මාර්ග කි.මී 34ක් ඉදි කිරීම හා කි.වෝ. 12GIS බෙදාහැරීම් පැනල 88ක් ස්ථාපනය කිරීම.<br>පැකේජ 03<br>බෙදාහැරීම් කාර්යයන් සඳහා විශේෂිත වාහන සැපයීම | ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය | 28,447 | 2014 පෙබරවාරි - 2019 |
| 24 | **300 kVA ක්ෂුද්‍ර ජාල (Micro Grid) නියමු ව්‍යාපෘතිය** | ආසියානු සංවර්ධන බැංකුව | 277 | 2016 ජනවාරි - 2020 දෙසැම්බර් |

# පරිච්ඡේදය 02

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## ප්‍රගතිය

### (i) ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ග

"ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ග" 2008 වර්ෂයේදී අංක 1553/10 හා 2008.06.10 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රථමවරට ප්‍රකාශයට පත් කරන ලදී. මෙරට විදුලියනය සම්පූර්ණ කිරීම හා පුනර්ජනනීය බලශක්තිය සංවර්ධනය කිරීම වැනි මෙම ප්‍රතිපත්ති ලේඛනයේ දක්වා ඇති ඉලක්ක කිහිපයක් සපුරා ගැනීමට හැකි විය. මෙම ප්‍රතිපත්තිය වසර තුනකට පසු සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතු අතර, ඒ අනුව "ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ග" යාවත්කාලීන කරන ලදී. මෙය මහජන මත විමසුම් හා ක්ෂේත්‍රයේ විශේෂඥයින්ගේ සමාලෝචනවලින් පසුව සිදු කළ දීර්ඝකාලීන කර්තව්‍යයකි. ශ්‍රී ලංකාවේ නව "ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපායමාර්ග" අංක 2135/61 හා 2019 අගෝස්තු 09 දිනැති රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද අතර, 2019 ඔක්තෝබර් 22 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. "ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපායමාර්ග" සංග්‍රහයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ පිරිසිදු, ආරක්ෂිත, තිරසාර, විශ්වසනීය හා ආර්ථික වශයෙන් ශක්‍ය බලශක්ති සැපයුමක් භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ සමබර සංවර්ධනය සඳහා පහසු සහ දැරිය හැකි බලශක්ති සේවාවන් ලබා දීම සහතික කිරීමයි.

මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සහ එහි බලපෑම ඇගයීම සඳහා ජාතික මෙහෙයුම් කමිටුවක් පත් කරන ලදී. රැස්වීම් කැඳවීම සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම, ප්‍රගති තොරතුරු හා අදාළ නියෝජිතායතන සමග ලිපි ගනුදෙනු කිරීම සඳහා, ඉහත කාරක සභාවට සහාය වීමට, තාක්ෂණික ක්‍රියාකාරී කමිටුවක් පත් කරන ලදී.

### (ii) ජාතික විදුලියනය 99.9%ට ළඟා වීම.

ජාතික විදුලියන අනුපාතය 2019 වර්ෂයේදී 99.9% දක්වා ළඟා වී ඇත. මේ වන විට මෙරට විදුලිය සඳහා ප්‍රවේශ වීමේ හැකියාව 100% කි.

### (iii) විදුලි පාරිභෝගික වර්ධනය

2019 දෙසැම්බර් වන විට රටේ සමස්ත විදුලි පාරිභෝගික සංඛ්‍යාව 7,022,103 කි. විවිධ කාණ්ඩ යටතට ගැනෙන පාරිභෝගිකයින් සංඛ්‍යාව පහත දැක්වේ.

| විදුලි පාරිභෝගික සංඛ්‍යාව | |
|---|---|
| **පාරිභෝගික කාණ්ඩය** | **2019 වර්ෂය අවසන් වන විට** |
| ගෘහස්ථ | 6,084,851 |
| ආගමික ස්ථාන | 42,796 |
| පොදු අවශ්‍යතා | 818,854 |
| කර්මාන්ත | 66,967 |
| රාජ්‍ය | 4,552 |
| හෝටල් | 529 |
| තොග+වීදි ලාම්පු | 3,554 |
| **එකතුව** | **7,022,103** |




## (iv) විදුලි ජනනය ඉහල නැංවීම

ජාතික විදුලිබල පද්ධතියේ ස්ථාපිත විදුලි ජනන ධාරිතාව 2019 වර්ෂයේදී මෙගා වොට් 4,472 ක් වන අතර එය සූර්ය පියැසි විදුලි ජනනය හා හදිසි විදුලිය උත්පාදනය හේතුවෙන් පසුගිය වසරට වඩා 10% ක වැඩිවීමක් පෙන්නුම් කරයි. ශ්‍රී ලංකාව යනු පුනර්ජනනීය බලශක්ති සම්පත් බහුල වශයෙන් දායාද වී ඇති රටකි. ශ්‍රී ලංකාවේ විදුලිබල පද්ධතියේ ප්‍රධාන පුනර්ජනනීය විදුලි උත්පාදන ප්‍රභවය ජල විදුලියයි. සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (NCRE) ලෙස හඳුන්වන කුඩා ජල විදුලි, සුළං, සූර්ය, ඩෙන්ඩ්‍රෝ සහ ජෛව ස්කන්ධ වැනි අනෙකුත් පුනර්ජනනීය ප්‍රභවයන් ද පද්ධතියට සම්බන්ධ කරනු ලබයි. ගල් අඟුරු හා තාප තෙල් (ඩීසල් හා ඇව්තෙල්) තාප බලශක්ති ප්‍රභවයන් වන අතර ඒවා ලංකා විදුලිබල මණ්ඩලය හා ස්වාධීන බලශක්ති නිෂ්පාදකයන් සතු වේ.

මෙගාවොට් 4,234ක සමස්ථ ස්ථාපිත ධාරිතාවට අමතරව, 2016 වර්ෂයේදී ආරම්භ කරන ලද "සූර්යබල සංග්‍රාමය" (සූර්ය පියසි) වැඩසටහන හරහා පාරිභෝගිකයින් 31,825 ක් විසින් පියැසි මත ඉදිකරන ලද සූර්ය පැනල මගින් මෙ.වො. 238 ක ධාරිතාවයක් පද්ධතියට සම්බන්ධ කර ඇත.

| මූලාශ්‍රය | | ධාරිතාව (මෙගා වොට්) | විදුලි බලාගාර සංඛ්‍යාව |
|---|---|---|---|
| ප්‍රධාන ජල විදුලිය | | 1400 | 17 |
| තාප | | | |
| | ඛනිජ තෙල් (ලංවිම) | 604 | 9 |
| | ඛනිජ තෙල් (ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින්) | 701 | 6 |
| | ගල් අඟුරු | 900 | 1 |
| පුනර්ජනනීය බලශක්ති | | | |
| | කුඩා පරිමාණ ජල විදුලි | 406 | 190 |
| | සුළං | 129 | 15 |
| | සූර්ය | 51.4 | 8 |
| | ඩෙන්ඩ්‍රෝ හා ජෛව ස්කන්ධ | 43 | 11 |
| | සූර්ය පියසි | 238 | |
| **එකතුව** | | **4,472** | **257** |

2019 දෙසැම්බර් අවසානය වන විට ගිගාවොට් පැය 15,880 ක විදුලිය ජනනය කර ඇත. සමස්ථ ජනනනයෙන් 24% ක්ම ජල විදුලිය වන අතර (කුඩා ජල විදුලි බලාගාර නොමැතිව), ගල් අඟුරු 34%කින් සමස්ත ජනනයට දායක වී ඇති අතර, තාප තෙල් දායකත්වය 31% කි. සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ප්‍රභව වන කුඩා ජල විදුලි, සූර්ය, සුළං සහ ජෛව ස්කන්ධ දායකත්වය 10%කි. සූර්ය පියසි විදුලි ජනනයේ දායකත්වය, බලශක්ති සංයුතියෙන් 1%කි.




## (v) සූර්ය පියසි වැඩසටහන - සූර්යබල සංග්‍රාමය

මෙම වැඩසටහන 2016 සැප්තැම්බර් මාසයේදී දියත් කරන ලදී. මෙහි ඉලක්කය වසර 2025 වන විට පියැසි මත ස්ථාපිත සූර්ය විදුලි ජනන පද්ධති 1,000,000 ක් මගින් මෙගාවොට් 1,000ක ධාරිතාවයක් ජනනය කිරීමයි.

2019 වර්ෂයේදී, පාරිභෝගිකයින් 5,532 ක් හරහා මෙගා වොට් 85ක සූර්යබල පද්ධති ධාරිතාවයක් ජාතික විදුලිබල පද්ධතියට එක් කරන ලදී. එය පහත වගුව මගින් දක්වා ඇත.

| 2019<br>ජනවාරි සිට දෙසැම්බර් | ධාරිතාව<br>(කිලෝ වොට්) | පද්ධති සංඛ්‍යාව |
|---|---:|---:|
| ජනවාරි | 6,017 | 410 |
| පෙබරවාරි | 5,162 | 399 |
| මාර්තු | 4,184 | 379 |
| අප්‍රේල් | 5,815 | 447 |
| මැයි | 6,883 | 381 |
| ජූනි | 10,098 | 521 |
| ජූලි | 8,983 | 564 |
| අගෝස්තු | 11,621 | 513 |
| සැප්තැම්බර් | 8,445 | 445 |
| ඔක්තෝබර් | 5,856 | 484 |
| නොවැම්බර් | 6,470 | 445 |
| දෙසැම්බර් | 5,756 | 544 |
| **එකතුව** | **85,290** | **5,532** |

### (vi) ජාතික බලශක්ති ඉල්ලුම් කළමනාකරණ වැඩසටහන, කාර්යක්ෂම බලශක්ති භාවිතය සහ බලශක්ති සංරක්ෂණය පිළිබඳ ජාතික වැඩසටහන - ඉල්ලුම් පාර්ශ්වීය බලශක්ති කළමනාකරණය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය.

රජය සිය ප්‍රතිපත්ති ප්‍රකාශනය මගින් බලශක්ති සංරක්ෂණයට හා කාර්යක්ෂම භාවිතයට ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දී ඇති අතර, 2007 අංක 35 දරණ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 36 (2) වගන්තියේ විධිවිධාන යටතේ "ඉල්ලුම් පාර්ශ්වීය බලශක්ති කළමනාකරණය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය" පිහිටුවා ඇත. වසර 2022 වන විට විදුලි ඉල්ලුම මෙගාවොට් 417කින් සහ සමස්ථ විදුලි පරිභෝජනය ගිගාවොට් පැය 1,684 කින් අඩු කර ගැනීම ඉලක්ක කර ගනිමින් ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් වැඩසටහන් යෝජනා කර ඇති අතර, එය වර්තමාන විදුලි ඉල්ලුමෙන් 20% කට සමාන වන අතර විදුලි පරිභෝජනයෙන් 10% ක ඉතිරියකි.

මේ යටතේ ක්‍රියාත්මක වන "ශක්ති" නම් LED විදුලි පහන් බෙදාදීමේ වැඩසටහන, මාසික විදුලි පරිභෝජනය ඒකක 90ට අඩු නිවාස ඒකක සඳහා 2019 වර්ෂයේ මාර්තු මාසයේ සිට දියත් කරන ලදී. එවැනි නිවාස සඳහා LED ලාම්පු මිලියන 10ක් බෙදා දීම ඉලක්ක කර ඇති අතර, ව්‍යාපෘතිය අවසානයේ රු. මිලියන 12,710 ක් ඉතිරි කිරීමට අපේක්ෂා කරන ලදී.

2019 වර්ෂයේදී LED විදුලි පහන් 383,469 ක් බෙදා දෙන ලදී.
වැඩසටහනේ සමස්ත බලශක්ති ඉතිරිය වාර්ෂිකව ගිගාවොට් පැය 11.447 කි.
මෙම වැඩසටහන නිසා 2019 වර්ෂය තුළ පිරිවැය ඉතිරිය රු. මිලියන 207.07 කි.

## (vii) ද්‍රවීකෘත ස්වාභාවික වායු (Liquefied Natural Gas - LNG) බලාගාර සංවර්ධනය සහ LNG සැපයුම ආරම්භ කිරීම. (2019 පිරිවැය)

**ද්‍රවීකෘත ස්වාභාවික වායු,** විදුලි ජනන ප්‍රභවයක් ලෙස මෙරටට හඳුන්වා දීමට අමාත්‍යාංශය පියවර කිහිපයක් ගෙන ඇත. මෙගා වොට් 300ක LNG දහන සංයුක්ත චක්‍රීය බලාගාරයක් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2019 වර්ෂයේදී අවසන් කරන ලදී.

## (viii) විදුලි බලාගාර ව්‍යාපෘතිවල ප්‍රගතිය

| අ.අ. | විදුලිබල ව්‍යාපෘතිය | ප්‍රගතිය | ඉදිරි දැක්ම |
|---|---|---|---|
| 01 | කෙරවලපිටියේ ඉදිකරන මෙගාවොට් 300 සංයුක්ත චක්‍රීය ද්විත්ව ඉන්ධන ස්වභාවික වායු විදුලි බලාගාර ව්‍යාපෘතිය - I | මෙම බලාගාරය ඉදි කිරීම සඳහා Consortium of Gel, Windforce and RenewGen සමාගමට ටෙන්ඩරය ප්‍රධානය කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.<br><br>විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම සඳහා නීතිපති විසින් අනුමැතිය ලබා දී ඇති අතර මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කොට ඇත. | ඉදිකිරීම් කටයුතු 2021 වන විට අවසන් කිරීම. |
| 02 | ලක්විජය ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය | මෙගා වොට් 900 ලක්විජය ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියට 4වන ඒකකය ලෙස තවත් මෙගා වොට් 300ක් එකතු කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. | මෙම 4වන ඒකකයේ ඉදිකිරීම් කටයුතු 2023 වන විට අවසන් කිරීම. |
| 03 | කෙරවලපිටියේ ඉදිකරන මෙගාවොට් 300 සංයුක්ත චක්‍රීය ද්විත්ව ඉන්ධන ස්වභාවික වායු විදුලි බලාගාර ව්‍යාපෘතිය - II | තාක්ෂණික ඇගයුම් කමිටුව සහ ටෙන්ඩර් මණ්ඩලය පත් කොට ඇත. ලංසු ලේඛන සකස් කරමින් පවතී. | ඉදිකිරීම් කටයුතු 2023 වන විට අවසන් කිරීම. |
| 04 | බ්‍රෝඩ්ලන්ඩ්ස් ජලවිදුලි ව්‍යාපෘතිය | 70%ක් ඉදිකිරීම් කටයුතු අවසන් වී ඇත. ණය ලබාගත් ICBC බැංකුව ණය ලබාදීමෙන් ඉවත්වීම හේතුකොටගෙන මහජන බැංකුවෙන් ණය ලබාගෙන ඉතිරි වැඩ අවසන් කිරීමට සැලසුම් කර ඇත. | ව්‍යාපෘතියේ කටයුතු 2019 අගෝස්තු වන විට අවසන් කිරීම. |
| 05 | රජයෙන් රජයට පදනම මත චීන රජය සමඟ ඒකාබද්ධව හම්බන්තොට ප්‍රදේශයේ ඉදිකිරීමට නියමිත ද්‍රවීකෘත ස්වභාවික වායු බලාගාරය | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ඉඩම් හඳුනාගෙන එම ඉඩම් ව්‍යාපෘතිය සඳහා වෙන් කිරීමට අදාල අංශ සමඟ කටයුතු කරමින් පවතී. | ලංකා විදුලිබල මණ්ඩලය විසින් සකස් කර ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දීර්ඝකාලීන |

| | | | |
|---|---|---|---|
| | | ව්‍යාපෘති යෝජක සමාගම, ලංකා විදුලිබල මණ්ඩලය සමග මෙම ව්‍යාපෘතිය සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | ජනන සැලැස්මට අනුව මෙම බලාගාරය ඉදි කිරීමට අවශ්‍ය කාල රාමුව තීරණය කරනු ලැබේ. |
| 06 | ජපාන රජය සමග ඒකාබද්ධව කෙරවලපිටිය ප්‍රදේශයේ ඉදිකිරීමට නියමිත ද්‍රවීකෘත ස්වභාවික වායු බලාගාරය | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන සහයෝගිතා ගිවිසුම සහ අවබෝධතා ගිවිසුම ජපාන රජය සමඟ අත්සන් කොට ඇත.<br>මෙම බලාගාරය ඉදි කිරීම සඳහා කෙරවලපිටිය ප්‍රදේශයෙන් අක්කර 100ක පමණ ඉඩමක් හඳුනාගෙන ඇති අතර එම ඉඩම අදාල ව්‍යාපෘතිය සඳහා වෙන් කර විදුලිබල මණ්ඩලයට දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | ලංකා විදුලිබල මණ්ඩලය විසින් සකස් කර ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දීර්ඝකාලීන ජනන සැලැස්මට අනුව මෙම බලාගාරය ඉදි කිරීමට අවශ්‍ය කාල රාමුව තීරණය කරනු ලැබේ. |
| 07 | ත්‍රිකුණාමලය ෆවුල් පොයින්ට් ප්‍රදේශයේ බලශක්ති උද්‍යානයක් ඉදි කිරීම | බලශක්ති උද්‍යානය ඉදි කිරීම සඳහා හෙක්ටයාර 207ක භූමි ප්‍රමාණයක් ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. | ලංකා විදුලිබල මණ්ඩලය විසින් සකස් කර ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දීර්ඝකාලීන ජනන සැලැස්මට අනුව මෙම බලාගාරය ඉදි කිරීමට අවශ්‍ය කාල රාමුව තීරණය කරනු ලැබේ. |

### (ix) ලංකා විදුලිබල මණ්ඩලයේ ක්‍රියාකාරකම් සඳහා ඉඩම් අත්කර ගැනීම. (2019 වර්ෂය)

| අ.අ. | ව්‍යාපෘති | තොරතුරු සහ අරමුණ | ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | සමනලවැව විදුලිබල ව්‍යාපෘතිය | රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම පිහිටා ඇත.<br>සමනලවැව ව්‍යාපෘතිය යටතේ ගිළුණු ඉඩම් අත්කර ගැනීම. | අක්කර 04<br>පර්චස් 04 |
| 02 | ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ජාල කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම පිහිටා ඇත.<br>බත්තරමුල්ල 132/33kV ග්‍රිඩ් උපපොළේ ප්‍රවේශ මාර්ගය සඳහා ඉඩම අත්කර ගැනීම. | පර්චස් 30 |

| | | | |
|---|---|---|---|
| 03 | පිවිතුරු බලශක්ති සහ ජාලගත කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය ( 03 වැනි පැකේජය) | කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම පිහිටා ඇත.<br>බී19/0 සම්ප්‍රේෂණ කුළුණ ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනිම | පර්චස් 23 |
| | | නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව කෝරලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම පිහිටා ඇත.<br>පොල්පිටිය ග්‍රිඩ් උපපොල ඉදිකිරීම සඳහා ඉඩම් ලබා ගැනිම | පර්චස් 161 |
| 04 | මන්නාරම සුළං විදුලිබල ව්‍යාපෘතිය | මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම පිහිටා ඇත<br>සුළං ටර්බයිනය පිහිටුවීම සඳහා ඉඩම අත්කර ගැනීම. | අක්කර 22<br>පර්චස් 88 |
| 05 | විදුලිය සැපයීමේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ උපකාරක ව්‍යාපෘතිය - පැකේජ 04 | මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම පිහිටා ඇත<br>වැල්ලවාය ද.වො.33 අධිසර විදුලි බෙදාහැරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉඩම අත්කර ගැනීම. | පර්චස් 15 |
| 06 | විදුලිය සැපයීමේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ උපකාරක ව්‍යාපෘතිය - පැකේජ 04 | කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිටිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම පිහිටා ඇත<br>මාඑළිය ද.වො.33 අධිසර විදුලි බෙදාහැරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉඩම අත්කර ගැනීම. | පර්චස් 18 |
| 07 | විදුලිය සැපයීමේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ උපකාරක ව්‍යාපෘතිය - පැකේජ 04 | කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම පිහිටා ඇත<br>රත්තනපිටිය ද.වො.33 අධිසර විදුලි බෙදාහැරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉඩම අත්කර ගැනීම. | අක්කර 01 |
| 08 | විදුලිය සැපයීමේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ උපකාරක ව්‍යාපෘතිය - පැකේජ 04 | පුත්තලම දිස්ත්‍රික්කයේ මුණ්ඩාල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම පිහිටා ඇත<br>කීරියන්කල්ලිය ද.වො.33 අධිසර විදුලි බෙදාහැරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉඩම අත්කර ගැනීම. | පර්චස් 15 |

**(x) ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රය සඳහා පරිසර හිතකාමී ඉන්ධන ලෙස හඳුන්වන ස්වභාවික ද්‍රවීකෘත වායු (LNG) හඳුන්වාදීම. මෙය ක්‍රියාත්මක කිරීමට පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන තිබේ.**

- දකුණු කොරියානු M/s SK E & S Company විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව පදනම් කරගෙන ස්විස් චැලේන්ජ්) Swiss Challenge( ප්‍රසම්පාදන ක්‍රමවේදය භාවිතා කර ඉදිකිරීමට යෝජිත ද්‍රවීකෘත ස්වභාවික වායු ගොඩබෑම සහ නැවත ගෑස් බවට පත් කිරීම සඳහා පාවෙන ස්වභාවික වායු පර්යන්තය
  - ➢ අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 17/1875/753/008 සහ 2017.08.17 දිනැති හා අංක 17/2464/727/051 සහ 2017.10.20 මගින් ඉදිරිපත් කරන ලද යෝජනා සඳහා පිළිවෙළින් 2017.08.29 සහ 2017.11.21 දිනවලදී ලද අමාත්‍ය මණ්ඩල අනුමැතින්ට අනුව මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි.
  - ➢ මෙම ව්‍යාපෘතියට අදාළව ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ Part – II- Supplement -30 හි 3.5 ඡේදයට අනුව ස්විස් චැලේන්ජ් ටෙන්ඩර් ක්‍රියාවලිය සඳහා පත්කරන ලද විශේෂ කමිටුව වෙනුවෙන්, ඉදිකිරීමට යෝජිත ද්‍රවීකෘත ස්වභාවික වායු ගොඩබෑම සහ නැවත ගෑස් බවට පත් කිරීම සඳහා පාවෙන ස්වභාවික වායු පර්යන්තය සඳහා මේ වනවිට මෙම අමාත්‍යාංශය විසින් ආයෝජකයින්ගෙන් ලංසු යෝජනා කැඳවා මේවන විට ව්‍යාපෘතියේ අවසාන වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

**(xi) ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා විදුලි (පුද්ගලික) සමාගම, සීමාසහිත වෙස්ට් කොස්ට් පුද්ගලික සමාගම, ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් සමාගම සහ ලක්දනවි සමාගම විසින් තම ව්‍යාපෘති (ග්‍රාමීය විදුලි යෝජනා ක්‍රම සහ පුනර්ජනනීය විදුලි යෝජනා ක්‍රම හැර) සඳහා ආනයනය කරනු ලබන යන්ත්‍රෝපකරණ වෙනුවෙන් එකතු කල අගය මත බදු, තීරු බදු, ජාතිය ගොඩනැගීමේ බදු හා වරාය ගුවන් තොටුපල බදු නිදහස් කිරීම සඳහා නිර්දේශ මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම.**

| | | |
|---|---|---|
| **ආදායම් සංරක්ෂණ අංක 02/2017 සහ 16.02.2017 දිනැති ආඥා පනත සහ අනුව තීරු බදු නිදහස් කිරීම.** | **2008 අංක 15 දරන වැට් පනත (සංශෝධිත) අනුව වැට් බදු වලින් නිදහස් කිරීම්**<br><br>**2009 අංක 32 දරණ (සංශෝධිත) ජාතිය ගොඩනැගීමේ බදු පනත අනුව ජාතිය ගොඩනැගීමේ බදු වලින් නිදහස් කිරීම්** | **"NFE" පදනම මත භාණ්ඩ ආනයනය කිරීම සඳහා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ලබා දීම.** |
| 1200 | 110 | 25 |

**(xii) ලංකා විදුලිබල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වලට අදාල කටයුතු සඳහා පැමිණෙන විදේශ කාර්ය මණ්ඩල වලට වීසා ලබා ගැනීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.**

**(xiii) මහජනතාවගෙන් ලැබුණු පැමිණිලි විසඳීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය, මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමග සම්බන්ධීකරණය කිරීම.**

**(xiv) දිවයිනේ විවිධ පළාත්වල ආගමික ආයතන විසින් සිදු කරනු ලබන ආගමික කටයුතු සඳහා විදුලිය සැපයීම සහ මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සඳහා ඉල්ලීම් ඉටු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම.**

## අභියෝග

1. විදුලිබල ක්ෂේත්‍රයේ මූල්‍ය තත්ත්වය
2. හඳුනාගෙන ඇති විදුලි බලාගාර නියමිත කාලයට ක්‍රියාත්මක කිරීම
3. ද්‍රවීකෘත ස්වභාවික වායු (LNG) සැපයුම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
4. සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජන
5. ආංශික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම
6. විදුලිබල ක්ෂේත්‍රය සඳහා නව තාක්ෂණයන් ක්‍රියාත්මක කිරීම (සුහුරු මනු, සුහුරු ජාල සංකල්ප)
7. පුනර්ජනනීය බලශක්ති සංකලනයේදී ජාලයට ආධාර වන උපයෝගී පද්ධති ප්‍රමාණවත් නොවීම නිසා වන තාක්ෂණික අභියෝග

## අනාගත අරමුණු

- වසර 2025 වන විට පද්ධතියේ තාක්ෂණික හා වාණිජ හානි 10 % සිට 8 % දක්වා අඩු කර ගැනීම
- සුහුරු ජාල සංකල්පය (Smart Grid concept) ක්‍රියාත්මක කිරීම
- කාබන් පහසුකම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- විශේෂිත ජනන තාක්ෂණයන්
- අක් වෙරළ සුළං බල ගොවිපල
- දුම්රිය මග විදුලියනය
- විදුලි වාහන ප්‍රවර්ධනය
- පුනර්ජනනීය බලශක්ති ගබඩා පහසුකම

## පරිච්ඡේදය 03

# 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අමාත්‍යාංශයට 2019 වර්ෂය සඳහා රු.මි.1502.4 ක මුළු ප්‍රතිපාදනයක් වෙන් කර තිබූ අතර එම ප්‍රතිපාදනය රු.මි. 775 ක පුනරාවර්ථන ප්‍රතිපාදනයකින් සහ රු.මි.727.4 ක මූලධන ප්‍රතිපාදනයකින් සමන්විත විය. උක්ත මූලධන ප්‍රතිපාදනයෙන් රු.මි. 240 ක මුදලක් අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් අවුරා තැබීමට කටයුතු කර ඇත. ඒ අනුව වැය කල හැකිව තිබූ මුළු මූලධන ප්‍රතිපාදනය රු. මි. 487.4 ක් විය.

පුනරාවර්ථන ප්‍රතිපාදනයෙන් රු.මි. 510.03 ක මුදලක් වර්ෂය තුල උපයෝජනය කර තිබූ අතර එය ප්‍රතිශතයක් ලෙස 65.8%කි. වැය කිරීම සඳහා බලය තිබූ මූලධන ප්‍රතිපාදනයෙන් රු.මි. 253 ක් උපයෝජනය කර තිබූ අතර එය වැය කල හැකිව තිබූ ප්‍රතිපාදනයෙන් 52% කි. සමස්ථ ප්‍රතිපාදනය සහ වැය කල හැකි ප්‍රතිපාදන උපයෝජනය සලකා බැලීමේදී 60% ක ප්‍රතිපාදන උපයෝජනයක් 2019 වර්ෂය තුල වාර්තා වේ.

ඒසීඒ-එෆ්

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| අයවැය 2019 | | සටහන | තත්‍ය 2019 | 2018 | |
|---|---|---|---|---|---|
| | **ආදායම් ලැබීම්** | | | | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළදාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 346,945,171 | 757,448,330 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 4,128,743 | 25,235,618 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 6,052,443 | 5,388,472 | ඒසීඒ-5 |
| - | වෙනත් ලැබීම් | | 5,007,411 | 6,068,668 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **362,133,768** | **794,141,088** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **362,133,768** | **794,141,088** | |
| | **අඩුකළා : වියදම්** | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 88,100,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 94,672,903 | 84,547,255 | |
| 168,650,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 152,175,642 | 149,485,470 | **ඒසීඒ-2(ii)** |
| 305,615,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 263,481,114 | 253,651,614 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| 100,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| **562,465,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඇ)** | | **510,329,659** | **487,684,339** | |
| | **මූලධන වියදම්** | | | | |
| - | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | - | 2,810,570 | |
| 6,500,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 4,713,825 | 3,017,991 | |
| 238,000,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 138,130,800 | 154,212,341 | **ඒසීඒ-2(ii)** |
| 100,000,000 | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | | - | |
| 2,000,000 | හැකියා වර්ධනය | 14 | 635,565 | 2,056,350 | |
| 237,600,000 | වෙනත් මූලධන වියදම් | 15 | 109,544,259 | 343,237,679 | |
| **584,100,000** | **මුළු මූලධන වියදම් (ඉ)** | | **253,024,449** | **505,334,931** | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **10,638,601** | 32,948,869 | |
| | **තැන්පතු ගෙවීම්** | | 3,216,255 | 25,954,207 | **ඒසීඒ-4** |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 7,422,346 | 6,994,662 | **ඒසීඒ-5** |
| | **මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)** | | **773,992,709** | **1,025,968,139** | |
| - | **2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)** | | **(411,858,941)** | **(231,827,050)** | |

## 3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ-පී**

**2019 දෙසැම්බර් 31 දිනට**

**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | | තත්‍ය | |
|---|---|---|---|
| | සටහන | **2019**<br>රු. | **2018**<br>රු. |
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 302,519,501 | 299,538,945 |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 23,728,660 | 12,155,972 |

| | | | |
|---|---|---|---|
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 271,106 | 13,307,976 |
| **මුළු වත්කම්** | | **326,519,267** | **325,002,894** |
| **<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>** | | | |
| ශුද්ධ වත්කම් | | 12,541,842 | 12,084,426 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 302,519,501 | 299,538,945 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | 10,202,784 | - |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 984,034 | 71,546 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 271,106 | 13,307,976 |
| **මුළු වගකීම්** | | **326,519,267** | **325,002,894** |

පිටු අංක 06 සිට 59 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 60 සිට 76 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

........................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2020.02.26

වසන්තා පෙරේරා
ලේකම්
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
අංක. 72, ආනන්ද කුමාරස්වාමි මාවත,
කොළඹ - 07.

..................
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

........................................
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2020.02.26

එස්. කේ. මලවිසූරිය
ප්‍රධාන මූල්‍ය නිලධාරි
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
අංක. 72, ආනන්ද කුමාරස්වාමි මාවත,
කොළඹ - 07.

## 3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ-සී**

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සතය 2019 රු. | 2018 රු. |
|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | 99,206 | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | 930,459 | 2,976,607 |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 1,725,807 | 759,390,533 |
| වෙනත් දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ මගින් එකතු කරන ලද ආදායම් | - | - |
| අග්‍රිම ලැබීම් | 333,637,194 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **336,392,666** | **762,367,140** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 234,943,677 | 259,615,832 |
| සහනාධාර සහ මාරුකිරීම් | 34,935,198 | 15,354,140 |
